# 2023

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்று அறிக்கை

ANNUAL PERFORMANCE REPORT









## වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

## கரையோரம் பேணல் மற்றும் கரையோர மூலவள முகாமை திணைக்களம்

## Coast Conservation and Coastal Resource Management Department

# 2023

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව
## வருடாந்த செயலாற்று அறிக்கை
## ANNUAL PERFORMANCE REPORT


**වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව**
கரையோரம் பேணல் மற்றும் கரையோர மூலவள முகாமை திணைக்களம்
**Coast Conservation and Coastal Resource Management Department**

# පටුන


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය ..... 05

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම ..... 10

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය ..... 21

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක ..... 46

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ..... 47

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ ..... 49

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව ..... 50


01 පරිච්ඡේදය

# ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සරාංශය

## 1.1 හැඳින්වීම

කොළඹ වරාය කොමිසම යටතේ වෙරළ ආරක්ෂණ ඒකකයක් 1963 දී ස්ථාපිත කරන ලද අතර, 1978 දී ධීවර කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යාංශය යටතේ වෙරළ සංරක්ෂණ අංශය පිහිටුවන ලදි. ආර්ථික සම්පත් බහුල ශ්‍රී ලංකාවේ වෙරළ තීරය සංරක්ෂණය කිරීම මගින් වෙරළබඩ සම්පත් මත පදනම් වූ ආරක්ෂිත හා තිරසාර සංවර්ධනයකට ඉඩ ප්‍රස්ථා සැලසීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව, වෙරළ සංරක්ෂණ අංශය, 1984.01.01. දින සිට "වී ශ්‍රේණියේ" දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත කරන ලදි. දිවයිනේ වෙරළ තීරය සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවට ඇති වගකීම අනුව දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන වාර්ෂික ප්‍රතිපාදන වලින් වැඩි ප්‍රමාණයක් යෙදවීමට සිදුව ඇත්තේ වෙරළ තීරයේ ස්ථායිකරණ වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වේ. වෙරළ ස්ථායිකරණ වැඩසටහන් මගින් වෙරළබඩ ක්‍රියාවලිය කළමනාකරණය කර වෙරළ කලාපයේ සිදුකරන සංවර්ධන කටයුතු වල තිරසාර බව පවත්වා ගන්නා ලෙසම වෙරළබඩ සංවර්ධන කටයුතු හා වෙරළ සම්පත් කළමනාකරණය කිරීම මගින් පරිසරයේ ගුණාත්මක බව පවත්වා ගැනීම ද වැදගත් වන බැවින් 1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත මගින් ශ්‍රී ලංකාවේ වෙරළ කලාපයේ පරිපාලනය, පාලනය, භාරකාරීත්වය සහ කළමනාකරණය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය වෙත පවරන ලදි. 1981 අංක 57 දරණ පනත 1988 අංක 64 සහ 2011 අංක 49 පනත් මගින් සංශෝධිත අතර, පනතේ විධිවිධාන පරිපාලනය කිරීම, වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය සඳහා වූ වැඩ යෝජනා සකස් කිරීම හා ඒවා ක්‍රියාවෙහි යෙදවීම, වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇතුලු පනතේ 4 වන වගන්තියේ සඳහන් කාර්යය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත්කෙරිණි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු



### දැක්ම

දකුණු ආසියානු කලාපය තුළ තිබෙන දර්ශනීය, ආරක්ෂිත හා විවේකය ගත කිරීම සඳහා සුදුසුම වූ වෙරළ තීරයන් සහිතව වෙරළ සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කර ඇති රට ලෙස ශ්‍රී ලංකාව ප්‍රමුඛත්වය ලබා ගැනීම.

### මෙහෙවර

වෙරළ සම්පත් තිරසාර ලෙස සංවර්ධනය කිරීමත් වෙරළබඩ ක්‍රියාවලියන් කළමනාකරණය කිරීම මගින් ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික සහ පාරිසරික තත්වයන් ප්‍රශස්ථ මට්ටමක් කරා යොමු කිරීම වේ.

### අරමුණු

1. වෙරළබඩ පරිසරයේ තත්ත්වය වැඩි දියුණු කිරීම.
2. වෙරළ තීරය සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම.
3. වෙරළබඩ යටිතල පහසුකම් ආරක්ෂණය කිරීම.
4. වෙරළබඩ ප්‍රජාවගේ සහ සම්පත් භාවිතා කරන්නන්ගේ ජීවන තත්වය උසස් කිරීම.
5. වෙරළ සම්පත් මත පදනම් වූ ආර්ථික සංවර්ධනය පහසු කර වීම සහ ප්‍රවර්ධනය කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

1. හදිසි වෙරළ බාදන තත්ත්වයන්ගේ බලපෑම අවම කිරීම.
2. දීර්ඝ කාලීන වෙරළ ආරක්ෂණ විසඳුම් ලබාදීම.
3. වෙරළතීර කළමනාකරණ ක්‍රමෝපායන් සැකසීම.
4. වෙරළ විමර්ශනය කිරීම.
5. සාගර තරංග මැනීම අධ්‍යනය කිරීම.
6. වෙරළ පර්යේෂණ ව්‍යාපෘති සකස් කිරීම.
7. අක් වෙරළ (near-shore) කලාපයේ සාගර පතුලේ වෙනස්කම් අධීක්ෂණය කිරීම.
8. වෙරළ සැලසුම් මාර්ගෝපදේශනය යාවත්කාලීන කිරීම.
9. වෙරළ අධීක්ෂණය සහ ඇගැයීම.
10. වෙරළ පරිහරණය කරන්නන්ට හිතකර තිරසාර වෙරළ ඉදිකිරීම් ඇති කිරීම.
11. වෙරළ කලාපය තුල වෙරළ ව්‍යුහ ඉදිකිරීමට මඟ පෙන්වීම.
12. වෙරළ ආපදා සිතියම් සැකසීම. (සුනාමි, සාගර මට්ටම ඉහළ යාම, සුළි කුණාටු සහ වෙරළ බාදනය)
13. වෙරළ ආරක්ෂණ සැලසුම් බාහිර ආයතන සඳහා ලබාදීම.
14. ගංගා මුවදොර කළමනාකරණය සඳහා ව්‍යුහ සැලසුම් කිරීමට සහය වීම.
15. වෙරළ ජල තත්ත්ව අධීක්ෂණ ව්‍යාපෘතිය සිදුකිරීම.
16. වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම යාවත්කාලීන කිරීම.
17. මුහුදු හිරිගල් ඉවත් කිරීම සහ මුහුදු වෙරළින් වැලි ඉවත් කිරීම පාලනය කිරීම.
18. වෙරළබඩ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් පාරිසරික තක්සේරු ලබා ගැනීම.
19. සංවර්ධන කටයුතු බලපත්‍ර වල අඩංගු කොන්දේසි වලට අනුකූල වන බව සහතික කිරීම.
20. පාඨශාලා සඳහා විෂයය මාලාවන් සංවර්ධනය කිරීම ඇතුලත්ව වෙරළබඩ ගැටළු පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම.
21. වෙරළබඩ සම්පත් කළමනාකරණයේ දී ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.
22. විශේෂ වෙරළ කලාප කළමනාකරණ සංකල්පය යටතේ වෙරළ ප්‍රජාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා සියළුදෙනාගේ සහභාගීත්වය මගින් වෙරළබඩ කළමනාකාරිත්වය සඳහා යොමු කිරීම.
23. බලපෑමට ලක්වන ප්‍රදේශ, සංරක්ෂණ ප්‍රදේශ හා විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම හා එම ප්‍රදේශ නිසි කලමනාකරණය කිරීම.
24. වෙරළ උද්‍යාන ඇති කිරීම.
25. වෙරළ ප්‍රවේශ සැලැස්මක් සකස් කිරීම මගින් වෙරළ පිවිසුම් පහසු කිරීම.
26. වෙරළ කලාපයේ අනවසර ඉදිකිරීම් හා අනවසර ඉඩම් හෝ ජලස්කන්ධ ගොඩකිරීම් පාලනය කිරීම.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ පැවති වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව අංක: 1651/20 දරණ 2010.04.30 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ 04 වන පරිච්ඡේදයේ පරිදි වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය යටතට පවරනු ලැබිණි.

අනතුරුව නැවතත් 2010.11.22 දිනැති අංක 1681/3 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගින් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතට ගනු ලැබිණි. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ නාමය 2011.10.07 දින සිට "රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය" ලෙස සංශෝධනය විය.

2011 අංක 49 දරණ වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද අතර, නව සංශෝධනය වර්ෂ 2011 දෙසැම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලදි. නව සංශෝධන පනත මගින් "වෙරළ සංරක්ෂණ" යන වචනය "වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ" ලෙස සංශෝධනය විය.

ඒ අනුව දෙපාර්තමේන්තු නාමය ද "වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව" ලෙස වෙනස් විය.


මෙම වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත මඟින් නව නීති ප්‍රතිපාදනයන් රාශියක් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතට එක් වී ඇති අතර, එමඟින් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ද පුළුල් වී ඇත. එසේ එක් වූ නව නීති ප්‍රතිපාදන යන් මෙසේය.

- පනතේ නාමය "වෙරළ සංරක්ෂණ පනත වෙනුවට වෙරළ සම්පත් කළමනාකරණ පනත" ලෙස වෙනස් වීම.
- සංශෝධිත පනතට අනුව "වෙරළ කළාපයට" අයත් ප්‍රදේශය පුළුල් වීම.
- "වෙරළ කළාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලසුම" සකස් කිරීම සඳහා නීති ප්‍රතිපාදන ලැබීම.
- බලපෑමට ලක් වූ ප්‍රදේශ, සංරක්ෂණ ප්‍රදේශ, වෙරළ උද්‍යාන හා විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස නම් කිරීමට හා ඒ සඳහා රෙගුලාසි සකස් කිරීමට ප්‍රතිපාදන ලැබීම.
- වෙරළ කළාපයේ යම් අනවසර පිරවීමත් එම පිරවීම් ඉවත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට නිතිමය ප්‍රතිපාදන ලැබීම.
- අනවසර සංවර්ධන කටයුතු සඳහා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පොලිස් බලතල ලබාදීම.
- මෙම අනවසර සංවර්ධන කටයුතු සඳහා මහෙස්ත්‍රාත්වරයකුට ඇප ලබාදිය නොහැකි බව හා අදාල දඩ මුදල් වැඩි කිරීම.
- මෙම අනවසර ක්‍රියාවන් සඳහා පාලනය කිරීම වෙනුවෙන් අදාළ නිලධාරීන් දිරිමත් කිරීම සඳහා වෙරළ ආරක්ෂක තෑග අරමුදලක් පිහිටුවීම.

නැවතත් 2015.09.21 දිනැති අංක 1933/13 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයක් මඟින් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය යටතට ගනු ලැබිණි.

අනතුරුව 2019.12.10 දිනැති අංක 2153/12 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් මෙම දෙපාර්තමේන්තුව, පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍යාංශය යටතට ගනු ලැබිණි. 2020.08.09 දිනැති 2187/27 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් නැවතත් නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය යටතේ නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතට ගනු ලැබූ අතර 2021.07.07 දිනැති අංක 2235/45 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් වෙරළ සංරක්ෂණ සහ පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතට ගනු ලැබීය. නැවතත් 2022.07.22 දිනැති 2289/43 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් නැවතත් නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය යටතට ගනු ලැබිය.

## 1.4 සංවිධාන සටහන


Organization Chart of Coast Conservation & Coastal Resource Management Department
Director General
Department of Coast Conservation
Additional Director General (Development)
Additional Director General (Coastal Engineering)
SLES (Specal)
Director
(Admin)
SLAS Class 1
Chief Internal Auditor
SLAccS Class 1
Chief Accountant
SLAccS Class 1
Director
(Coastal Resource Management)
Deputy Director
(Coastal Resource Management)
Deputy Director
(Monitoring & Eva.)
SLES Class II
Chief Engineer
(Research & Design)
SLES Class 1
Deputy Director
(Research and Design)
SLES Class II
Chief Engineer
(Coastal Development)
SLES Class 1
Deputy Director
(Coastal Development)
SLES Class II
Deputy/Assistant Director
(Admin)
Legal Officer
Accountant
Assistant Director
(Head Office)
Assistant Director
(Area Offices)
Hydro Graphic
Surveyor
Engineer (Civil)
Engineer
(Mechanical)
Engineer (Civil)
(Head Office)
Engineer (Civil)
(Area Offices)
Administrative Officer
Legal Assistant
Development
Officer
Development
Officer
Development
Officer
Development
Officer
Coast
Conservation Chief
Inspector
Librarian
IT Assistant
G.I.S.
Officer
Draughtsman
Chief Inspector
Of Works
Technical
Officer
Technical
Officer
Field Officer/
Development
Officer
Management
Asst.
Management
Asst.
Management
Asst.
Management
Asst.
Management
Asst.
Management
Asst.
Management
Asst.
C.Con.Inspector/C.Con.
Sergeant/C.Con.Guard
C.Con.Inspector/C.Con
.Sergeant/C.Con.Guard
Inspector of Works/
Field Labour/ /Watcher
Driver
Bungalow
Keeper
Office
Assistant
Office
Assistant
Office
Assistant
Office
Assistant
Office
Assistant
Office
Assistant
Office
Assistant
Surveyor
Assistant
Machine Operator/ Fitter/Carpenter/
Chaser/Electrician/ Welder/Tinker
Driller and
Explorer

**1.5 අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශිය ලේකම් කාර්යාලය**

**1.6 අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුව /පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්**

**1.7 විදේශ අධාර ලබන ව්‍යපෘති තොරතුරු (තිබේ නම්)**

අ) ව්‍යාපෘතියේ නම
ආ) දායක නියෝජිතායතනය
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු.මි.
ඈ) ව්‍යාපෘති කාල සීමාව

} අදාල නැත.

| ශීර්ෂය | වැඩසටහන හා ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | 2023 වර්ෂයේ වෙන් කළ මුදල රු. මිලි. | මූල්‍ය හා භෞතික ප්‍රගතිය (රු. මිලියන) | | (%) | පැන නැගී ඇති ගැටළු |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන වත්කම් වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම. | 2001 | කාර්යාල සහ නවාතැන්පොලවල ගොඩනැගිලි පුනරුත්තාපනය කිරීම. | 2.50 | මූ.ප්‍ර. | 726,855.00 | 29.07% | |
| | | | | භෞ.ප්‍ර. | ප්‍රදේශීය කාර්යාල වල අලුත්වැඩියා කටයුතු සිදු කිරීම. | | |
| | 2002 | පිරියත යන්ත්‍රසූත්‍ර සහ අනෙකුත් උපකරණ නඩත්තුව. | 8.00 | මූ.ප්‍ර. | 7,984,544.51 | 99.8% | |
| | | | | භෞ.ප්‍ර. | එස්කැවේටර් යන්ත්‍ර 05ක් අලුත්වැඩියා කර ඇත. | | |
| | 2003 | වාහන | 9.50 | මූ.ප්‍ර. | 7,765,659.58 | 81.74% | |
| | | | | භෞ.ප්‍ර. | වාහන 20ක් අලුත්වැඩියා කර ඇත. | | |
| **උප එකතුව** | | | **20.00** | | **16,477,059.09** | **82.4%** | |
| ප්‍රධාන වත්කම් අත්පත් කර ගැනීම. | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 0.20 | මූ.ප්‍ර. | 115,050.00 | 57.5% | |
| | | | | භෞ.ප්‍ර. | ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීම | | |
| | 2103 | යන්ත්‍රසූත්‍ර සහ අනෙකුත් උපකරණ මිලදි ගැනීම්. | 0.20 | මූ.ප්‍ර. | 194,500.00 | 97.3% | |
| | | | | භෞ.ප්‍ර. | එස්කැවේටර් සහ ලොඩර් යන්ත්‍ර සඳහා අමතර කොටස් මිලට ගැනීම සිදු කර ඇත. | | |
| | 2104 | ගොඩනැගිලි | 0.15 | මූ.ප්‍ර. | 0.00 | 0.0% | |
| | | | | භෞ.ප්‍ර. | | | |
| **උප එකතුව** | | | **0.55** | | **309,550.00** | **56.3%** | |
| පුද්ගල හැකියාව වර්ධන කිරීම. | 2401 | පුහුණු කිරීම් සහ පුද්ගලික හැකියා වර්ධනය කිරීම. | 1.00 | මූ.ප්‍ර. | 531,770.00 | 53.18% | |
| | | | | භෞ.ප්‍ර. | කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් 02ක් සිදු කර ඇත. | | |
| **උප එකතුව** | | | **1.00** | | **531,770.00** | **53.18%** | |

| ශීර්ෂය | වැඩසටහන හා ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | 2023 වර්ෂයේ වෙන් කළ මුදල රු. මිලි. | මූල්‍ය හා භෞතික ප්‍රගතිය (රු. මිලියන) | | (%) | පැන නැගී ඇති ගැටළු |
|---|---|---|---|---|---|---|---|
| වෙරළ ඉංජිනේරු විමර්ශන | 2502.1 | වෙරළබඩ ඉංජිනේරුමය නිර්මාණ | 0.10 | මූ.ප්‍ර. | 71,592.00 | 71.6% | |
| | | | | භෞ.ප්‍ර. | වෙරළ ආරක්ෂක ව්‍යුහ සැලසුම් 17ක් අවසන් කර ඇත. | 100.0% | |
| | | "වෙරළබඩ ඉංජිනේරුමය විමර්ශන" | 4.20 | මූ.ප්‍ර. | 4,950,335.00 | 117.9% | |
| | | | | භෞ.ප්‍ර. | කළුතර, ඉරණවිල හා නින්දවූර් වෙරළ තීර ඩ්‍රෝන මඟින් සිතියම් ගත කර ඇත. | 100.0% | |
| | | වෙරළබඩ ජල තත්ව පරීක්ෂාව | 1.00 | මූ.ප්‍ර. | 933,250.00 | 93.3% | |
| | | | | භෞ.ප්‍ර. | අවසන් කෙටුම්පත් වාර්තාව අවසන් කර ඇත. | 100.0% | |
| | | වෙරළබඩ අධ්‍යයනයන් | 0.50 | මූ.ප්‍ර. | 499,900.00 | 100.0% | |
| | | | | භෞ.ප්‍ර. | | | |
| | | | | | ශ්‍රී ලංකාවේ වෙරළ තීර වෙනස් වීම, වෙරළ ආරක්ෂක ව්‍යුහ සිතියම්ගත කිරීම සිදුකරමින් පවතී. | 80.0% | |
| **උප එකතුව** | | | **5.80** | | **6,455,077.00** | **111.3%** | |

| ශීර්ෂය | වැඩසටහන හා ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | 2023 වර්ෂයේ වෙන් කළ මුදල රු. මිලි. | මූල්‍ය හා භෞතික ප්‍රගතිය (රු. මිලියන) | | (%) | පැන නැගී ඇති ගැටළු |
|---|---|---|---|---|---|---|---|
| වෙරළ කලාප කළමනාකරණ වැඩසටහන | 2502.2 | වෙරළ දූෂණය අවම කිරීම / වෙරළ පිරිසිදු කිරීම. | 1.00 | මූ.ප්‍ර. | 793,110.00 | 79.3% | |
| | | | | භෞ.ප්‍ර. | වැඩසටහන් 102ක් සිදු කර ඇත. | 100.0% | |
| | | පාරිසරික අධ්‍යාපනික වැඩසටහන් | 1.00 | මූ.ප්‍ර. | 13,318 | 1.3% | |
| | | | | භෞ.ප්‍ර. | වැඩසටහන් 12ක් සිදු කර ඇත. | 100.0% | |
| | | ආරුගම්බේ, උල්ල (අම්පාර) බලපෑමට ලක් වූ ප්‍රදේශ ලෙස හඳුනාගෙන විශේෂ ප්‍රදේශ ලෙස ගැසට් කිරීම. | 0.50 | මූ.ප්‍ර. | 95,681.00 | 19.1% | |
| | | | | භෞ.ප්‍ර. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගැසට් කිරීම ඔවුන් විසින් සිදු කිරීමට තීරණය කරන ලදී. | 100.0% | |
| | | ස්ථිර තුරුලතා තීරය ලකුණු කිරීම (ත්‍රිකුණාමලය, මුලතිව් සහ යාපනය) | 0.50 | මූ.ප්‍ර. | ප්‍රතිපාදන හිඟතාවය හේතුවෙන් තාවකාලිකව අත්හිටුවන ලදී. | | |
| | | | | භෞ.ප්‍ර. | | | |
| | | කඩොලාන තීරය ප්‍රතිෂ්ඨාපනය කිරීම | 0.50 | මූ.ප්‍ර. | 511,685.00 | 102.34% | |
| | | | | භෞ.ප්‍ර. | වැඩසටහන් 23ක් සිදු කර ඇත. | 100.0% | |
| | | ඊ - බලපත්‍ර ක්‍රියාවලිය | 4.00 | මූ.ප්‍ර. | 3,240,872.00 | 81.00% | |
| | | | | භෞ.ප්‍ර. | අයදුම්පත් 2421ක් ලැබී ඇති අතර ඉන් 2016ක් සඳහා බලපත්‍ර නිකුත් කර ඇත. | 100.0% | |
| | | අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීම. | 1.00 | මූ.ප්‍ර. | 703,310.00 | 70.30% | |
| | | | | භෞ.ප්‍ර. | ගාල්ල - 03, මාතර - 06, තංගල්ල - 14, වත්තල - 02 | 100.0% | |
| | | වෙරළ සංරක්ෂණ සහ වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම සංශෝධනය කිරීම 2021 සිට ක්‍රියාත්මක | 10.00 | මූ.ප්‍ර. | 6,633,243.00 | 66.3% | |
| | | | | භෞ.ප්‍ර. | කෙටුම්පත් වාර්තාව ලබා දී ඇත. | | |
| **උප එකතුව** | | | **18.50** | | **11,991,219.00** | **64.8%** | |

| ශීර්ෂය | වැඩසටහන හා ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | 2023 වර්ෂයේ වෙන් කළ මුදල රු. මිලි. | මූල්‍ය හා භෞතික ප්‍රගතිය (රු. මිලියන) | | (%) | පැන නැගී ඇති ගැටළු |
|---|---|---|---|---|---|---|---|
| වෙරළ ආරක්ෂක ව්‍යුහය ඉදි කිරීම | 2502.2 | මීටර් 400 රවට්මන්ට් බැම්ම ඉදිකිරීම අදියර I - කළුතර කැලිඩෝ (කළුතර) 2021 සිට ක්‍රියාත්මක | 11.00 | මූ.ප්‍ර. | 1,026,9218.16 | 93.36% | |
| | | | | භෞ.ප්‍ර. | මීටර් 200ක ඉදිකිරීම් කටයුතු 2022 වර්ෂයේදී අවසන් කර ඇත. (අදියර II) මීටර් 200 දිග රවට්මන්ට් බැම්මේ මීටර් 190ක ප්‍රමාණයක් අවසන් කර ඇත. (අදියර I) | 95.0% | |
| | | මීටර් 120ක ඇවිදින මංතීරුව ඉදිකිරීම - මිරිස්ස, බණ්ඩාරමුල්ල (මාතර) 2021 සිට ක්‍රියාත්මක | | මූ.ප්‍ර. | බාහිර හේතූන් නිසා අත්හිටුවා ඇත. | | |
| | | | | භෞ.ප්‍ර. | | | |
| | | ග්‍රොයින ශ්‍රේණිය ඉදිකිරීම - නින්දවූර් (අදියර I) | 47.00 | මූ.ප්‍ර. | 57,731,705.00 | 122.8% | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |
| | | මීටර් 200ක රවට්මන්ට් බැම්ම ඉදිකිරීම - උතුරු උඩප්පුව (පුත්තලම) | | මූ.ප්‍ර. | 2/2022 අයවැය චක්‍රලේඛය හේතුවෙන් අත්හිටුවන ලදී. | | |
| | | | | භෞ.ප්‍ර. | | | |
| | | මීටර් 100ක රවට්මන්ට් බැම්ම ඉදිකිරීම - කොරලවැල්ල (කොළඹ) | | මූ.ප්‍ර. | 2/2022 අයවැය චක්‍රලේඛය හේතුවෙන් අත්හිටුවන ලදී. | | |
| | | | | භෞ.ප්‍ර. | | | |
| | | හූ සළු රවට්මන්ට් බැම්ම ඉදිකිරීම - තිරාණගම, හික්කඩුව (ගාල්ල) | | | 2/2022 අයවැය චක්‍රලේඛය හේතුවෙන් අත්හිටුවන ලදී. | | |
| | | ග්‍රොයින ශ්‍රේණිය ඉදිකිරීම - සයින්දමර්දු සිට මාලිගායිකාඩු දක්වා (අම්පාර) | 49.40 | මූ.ප්‍ර. | 10,167,643.60 | 20.6% | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. (ග්‍රොයින 02ක් අවසන් කර ඇත.) | 30.0% | |
| **උප එකතුව** | | | **107.40** | | **78,168,566.76** | **72.8%** | |

| ශීර්ෂය | වැඩසටහන හා ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | 2023 වර්ෂයේ වෙන් කළ මුදල රු. මිලි. | මූල්‍ය හා භෞතික ප්‍රගතිය (රු. මිලියන) | | (%) | පැන නැඟී ඇති ගැටළු |
|---|---|---|---|---|---|---|---|
| වෙරළ ආරක්ෂක ව්‍යුහ අලුත්වැඩියා කිරීම | 2502.2 | මීටර් 500 රවට්මන්ට් බැම්ම අළුත්වැඩියා කිරීම - ලුනාව, මොරටුව (කොළඹ) 2021 සිට ක්‍රියාත්මක | 39.00 | මූ.ප්‍ර. | 40,776,588.02 | 104.5% | |
| | | | | භෞ.ප්‍ර. | මීටර් 190ක් අවසන් කර ඇත. මීටර් 240ක පැති බැම්ම අවසන් කර ඇත. | 90.0% | |
| | | අම්බලන්ගොඩ (ගාල්ල) තානායම පිටුපස ස්වභාවික පිහිනුම් තටාකය සංවර්ධනය කිරීම (ගාල්ල) 2021 සිට ක්‍රියාත්මක | 1.60 | මූ.ප්‍ර. | 1,561,833.83 | 97.6% | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |
| | | මීටර් 30 සහ මීටර් 80 ග්‍රොයින ශ්‍රේණි 03ක් අලුත්වැඩියා කිරීම - පෝරුතොට (ගම්පහ) 2021 සිට ක්‍රියාත්මක | 1.20 | මූ.ප්‍ර. | 1,135,540.00 | 94.6% | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |
| | | මීටර් 110ක ගේබියන් බැම්ම අලුත්වැඩියා කිරීම - තිරුක්කොවිල් (අම්පාර) | 7.00 | මූ.ප්‍ර. | 5,788,125.00 | 82.7% | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |
| | | කළුතර කලපුව තුල වැලි හාරා ඉවත්කිරීම (කළුතර) | | මූ.ප්‍ර. | බාහිර හේතූන් නිසා අත්හිටුවා ඇත. | | |
| | | | | භෞ.ප්‍ර. | | | |
| | | රවට්මන්ට් බැම්ම අළුත්වැඩියා කිරීම - කහව (ගාල්ල) | | මූ.ප්‍ර. | 2/2022 අයවැය චක්‍රලේඛය හේතුවෙන් අත්හිටුවන ලදී. | | |
| | | | | භෞ.ප්‍ර. | | | |
| | | මීටර් 250 රවට්මන්ට් බැම්ම අළුත්වැඩියා කිරීම - පහල කටුනේරිය (පුත්තලම) | 10.00 | මූ.ප්‍ර. | 8,696,651.66 | 87.0% | |
| | | | | භෞ.ප්‍ර. | මීටර් 85ක් අවසන් කර ඇත. මීටර් 165ක පැති බැම්ම අවසන් කර ඇත. | 40.0% | |
| | | දියකඩන බැම්ම දික් කිරීම - කොලන්ජාඩිය (පුත්තලම) | | මූ.ප්‍ර. | 2/2022 අයවැය චක්‍රලේඛය හේතුවෙන් අත්හිටුවන ලදී | | |
| | | | | භෞ.ප්‍ර. | | | |
| **උප එකතුව** | | | **58.80** | | **57,958,738.51** | **98.6%** | |

| ශීර්ෂය | වැඩසටහන හා ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | 2023 වර්ෂයේ වෙන් කළ මුදල රු. මිලි. | මූල්‍ය හා භෞතික ප්‍රගතිය (රු. මිලියන) | | (%) | පැන නැගී ඇති ගැටළු |
|---|---|---|---|---|---|---|---|
| හදිසි වෙරළ ආරක්ෂණ ව්‍යුහ | | ඉරණවිල | | මූ.ප්‍ර. | 20,209,070.29 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත | 100.0% | |
| | | උප්පාරු - අදියර II | 50.00 | මූ.ප්‍ර. | 2,785,250.00 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |
| | | කිරිමුන්දලම දූපත | | මූ.ප්‍ර. | 108,000.00 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |
| | | මුතූර් නාවික හමුදා කඳවුර අසල | | මූ.ප්‍ර. | 167,500.00 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |
| | | කාරතිව් | | මූ.ප්‍ර. | 994,225.00 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |
| | | නින්දවූර් | | මූ.ප්‍ර. | 2,063,008.95 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |
| | | බූස්ස | | මූ.ප්‍ර. | 2,298,409.45 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |
| | | තල්දියවත්ත | | මූ.ප්‍ර. | 10,542,287.50 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |
| | | කොග්ගල වෙරළ උද්‍යානය | | මූ.ප්‍ර. | 918,787.70 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |
| | | සයින්දමර්දු | | මූ.ප්‍ර. | 4,497,350.00 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |
| | | මාලිගායිකාඩු | | මූ.ප්‍ර. | 2,021,650.00 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |
| | | කාත්තන්කුඩි | | මූ.ප්‍ර. | 1,603,700.00 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත. | 100.0% | |

| ශීර්ෂය | වැඩසටහන හා ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | 2023 වර්ෂයේ වෙන් කළ මුදල රු. මිලි. | මූල්‍ය හා භෞතික ප්‍රගතිය (රු. මිලියන) | | (%) | පැන නැගී ඇති ගැටළු |
|---|---|---|---|---|---|---|---|
| හදිසි වෙරළ ආරක්ෂණ ව්‍යුහ | 2502.2 | උස්වැටකෙයියාව | | මූ.ප්‍ර. | 207,245.00 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත | 100% | |
| | | මරතමුනෙ | | මූ.ප්‍ර. | | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත (ගෙවීම් 2024) | 100% | |
| | | SMTI premises - ගාල්ල | | මූ.ප්‍ර. | 1,448,803.37 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කර ඇත | | |
| | | Whisky Point, පළඟතුරෙ, මූදූකටුව, වැල්ලමංකර, ආරුගම්බේ | | මූ.ප්‍ර. | 2,485,629.87 | | |
| | | | | භෞ.ප්‍ර. | | 100.0% | |
| **උප එකතුව** | | | **50.00** | | **52,350.917.13** | **104.7%** | |
| **2023 වර්ෂයේ බිල්පත් ගෙවීම්** | | | **24.00** | | **24,091,407,75** | **81.2%** | |
| **මුළු එකතුව** | | | **286.05** | | **248,334,305.24** | **86.8%** | |

## 2.2 අභියෝග

01. 2/2022 අයවැය චක්‍රලේඛය අනුව වෙරළ ආරක්ෂක ව්‍යාපෘති 06ක් අත්හිටුවා ඇති අතර ප්‍රතිපාදන හිඟතාවය හේතුවෙන් තවත් වෙරළ ආරක්ෂක ව්‍යාපෘති ඇතුළුව ව්‍යාපෘති කිහිපයක් 2023 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කරන ලදි.

02. ආයතනයේ කාර්යසාධනය සඳහා ඉංජිනේරුවරුන්, සහකාර අධ්‍යක්ෂකවරුන්, ජල විද්‍යා මිනින්දෝරු, තාක්ෂණ නිලධාරීන් සහ පුහුණු සහ නුපුහුණු සේවක මහතුන්ගේ හිඟතාව.

## 2.3 ඉදිරි ඉලක්ක

01. දෙපාර්තමේන්තුවට ආදායමක් උපයන පරිදි රාජ්‍ය*පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPP) ශ්‍රී ලංකාවේ වෙරළ තීරය තුල සංචාරක විභව ස්ථාන සංවර්ධනය කිරීම.

02. වෙරළ බාදනය අවම කිරීම සඳහා අවශ්‍ය සැලසුම්.

03. වෙරළ සම්පත් තිරසර කළමනාකරණය.

## 2.4 ඊ - බලපත්‍ර ක්‍රියාවලිය

| ලද අයදුම්පත් සංඛ්‍යාව | නිකුත් කරන ලද බලපත්‍ර සංඛයාව | ප්‍රතික්ෂේපිත අයදුම්පත් සංඛයාව | EIA/IEE ක්‍රියාවලිය යටතේ ඇති ව්‍යාපෘති |
|---|---|---|---|
| 2421 | 2016 | 345<br>(අවලංගු + ප්‍රතික්ෂේපිත) | EIA - 02<br>IEE - 03 |

| EIA | ව්‍යාපෘතිය |
|---|---|
| 01 | මන්නාරම සුළං බල ව්‍යාපෘතිය යටතේ දැනට පවතින තම්බපන්නි සුළං බලාගාරයේ යෝජිත ධාරිතාව වැඩි දියුණු කිරීම - පළමු අදියර දීර්ඝ කිරීම - ලංකා විදුලිබල මණ්ඩලය. |
| 02 | මෙගාවොට් 134 සුළං බල ව්‍යාපෘතිය (අදියර 2) - පුනරීන් - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය |

| IEE | ව්‍යාපෘතිය |
|---|---|
| 01 | කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පුනරීන් හි යෝජිත මෙගාවොට් 100 සුළං බල ව්‍යාපෘතිය (අදියර 1) - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය |
| 02 | යෝජිත නවීන ඉස්සන් ගොවිපල ව්‍යාපෘතිය - අරලිතුරෙයි, වේලනෙයි, යාපනය - අන්නායි සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගම |
| 03 | යෝජිත කාමර 63 කින් යුත් සීක්‍රට් බීච් රිසෝට් ව්‍යාපෘතිය (කෝපාරමුල්ල, මීරිස්ස - M.S.B.R. Development (Pvt) Ltd |

## 2.5 කඩොලාන තීර ප්‍රතිෂ්ඨාපනය කිරීම්

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ලන්දේසි බොක්ක ආශ්‍රිතව වර්ග මීටර් 1300ක කොරල් තීර ප්‍රතිෂ්ඨාපනය සහ කළුතර, ගාල්ල, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ යාපනය දිස්ත්‍රික්ක වල වෙරළ තීර ආවරණය වන පරිදි කඩොලාන තීර ප්‍රතිෂ්ඨාපන වැඩසටහන් 23ක් සිදු කර ඇති අතර වර්ග මීටර් 2,770ක් ආවරණය කර ඇත.

## 2.6 වෙරළබඩ දූෂණය අවම කිරීම / වෙරළ පිරිසිදු කිරීම්

| දිස්ත්‍රික්කය | වැඩසටහන් ප්‍රමාණය |
|---|---|
| පුත්තලම | 10 |
| ගම්පහ | 13 |
| කොළඹ | 09 |
| කළුතර | 03 |
| ගාල්ල | 06 |
| මාතර | 04 |
| හම්බන්තොට | 04 |
| අම්පාර | 22 |
| මඩකලපුව | 20 |
| ත්‍රිකුණාමලය | 09 |
| මන්නාරම | 01 |
| කිලිනොච්චිය | 01 |
| **එකතුව** | **102** |

## 2.7 වෙරළාරක්ෂක ව්‍යුහ ඉදිකිරීම

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘති ගණන | ආරක්ෂා කරන ලද වෙරළ දිග (මීටර්) |
|---|---|---|
| පුත්තලම | 01 | 160 |
| ගම්පහ | 02 | 200 |
| කොළඹ | | |
| කළුතර | 01 | 200 |
| මාතර | | |
| ගාල්ල | 01 | 25 |
| හම්බන්තොට | | |
| අම්පාර | 03 | 988 |
| මඩකලපුව | | |
| ත්‍රිකුණාමලය | | |
| මන්නාරම | | |
| **එකතුව** | **08** | **1,573** |

## 2.8 වෙරළ බාදනය වැළැක්වීමට ගනු ලැබූ පියවර

| වෙරළ ආරක්ෂක ව්‍යාපෘතිය | ආරක්ෂා කරන ලද ඵලදායී වෙරළ දිග |
|---|---|
| වෙරළ ආරක්ෂක ව්‍යුහ ඉදිකිරීම | මීටර් 1,160 |
| හදිසි වෙරළ ආරක්ෂක ව්‍යුහ ඉදිකිරීම | මීටර් 342 |
| වෙරළ ආරක්ෂක ව්‍යුහ නැවත ඉදිකිරීම හා නඩත්තු කිරීම | මීටර් 70 |
| **එකතුව** | **මීටර් 1,572** |

## 2.9 නිර්මාණ හා පර්යේෂණ අංශය

| ක්‍රියාකාරකම | සිදු කරන ලද වැඩසටහන් |
|---|---|
| වෙරළබඩ ඉංජිනේරුමය නිර්මාණ | වෙරළ ව්‍යුහාත්මක සැලසුම් - ඉරණවිල, කොරලවැල්ල, කළුතර මෝය, නින්දවුර් අදියර II, කහව, පහළ කටුනේරිය, උඩප්පුව, තිරාණගම, කොලින්ජාඩිය, සයින්දමරුදු මාලිගායිකාඩු සහ මරදමුනේ සැලසුම් 11ක් සම්පූර්ණ කර ඇති අතර ඊට අමතර විශයෙන් බාහිර පාර්ශවයන් සඳහා සැලසුම් 10ක් සිදු කර ඇත. |
| වෙරළබඩ ඉංජිනේරුමය විමර්ෂණ | ගුවන් ඡායාරූප මඟින් වෙරළ තීරය අධීක්ෂණය සහ ඡායාරූප ලබා ගැනීම. (කි.මී.15ක කළුතර, ඉරණවිල සහ නින්දවුර් ) |
| වෙරළබඩ අධ්‍යයනයන් | වෙරළ තීරයේ වෙනස් වීම් (shoreline changes) සහ Coastal Data base සකස් කිරීම aerial photography |

## 2.10 වෙරළබඩ ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම

| වෙරළ තීරය | පරාමිතීන් |
|---|---|
| පිතිපුර - වත්තල | pH අගය |
| මෝරවල - මීගමුව | උෂ්ණත්වය - C |
| මීගමුව වෙරළ උද්‍යානය | දිය වූ ඔක්සිජන් ප්‍රමාණය - mg/l |
| මීගමුව කලපුව | විද්‍යුත් සන්නායකතාවය - µS |
| | ලවණතාවය - µS |
| | තෙල් සහ ග්‍රීස් - Mg/l |
| | මළ අපද්‍රව්‍ය බැක්ටීරියා - #/100ml |

## 2.11 2023.12.31 දිනට ආදායම් ඉලක්ක / ප්‍රගතිය

| මාසය | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඉලක්කය (රු. මි.) | 4.0 | 4.0 | 4.0 | 4.0 | 4.0 | 4.0 | 4.0 | 4.0 | 4.0 | 4.0 | 4.0 | 4.0 | 48.0 |
| ප්‍රගතිය (රු. මි.) | 1.35 | 2.72 | 3.11 | 2.79 | 2.29 | 2.84 | 2.15 | 2.72 | 1.95 | 2.38 | 2.4 | 18.9 | 45.6 |

පරිච්ඡේදය 03

# 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 | | සටහන | තත්‍ය 2023 රු. | තත්‍ය 2022 රු. |
|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - |
| - | ආදායම් බදු | 1 | - | - |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - |
| - | ආදායම් නොවන ලැබීම් | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 504,398,000 | 469,617,221 |
| - | තැන්පතු | | 23,501,019 | 10,715,383 |
| - | අත්තිකාරම් ගිණුම් | | 11,874,654 | 9,950,761 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **539,773.673** | **490,283,365** |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | 539,773,673 | 490,283,365 |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) | | - | - |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)+(ඈ)** | | **539.773,673** | **490,283,365** |
| | **අඩු කළා : වියදම්** | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | |
| 267,500.000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 261,454,683 | 267,092,687 |
| 54,200,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 49,830,306 | 53,239,764 |
| 3,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 2,910,014 | 3,111,073 |
| - | පොළී ගෙවීම් | 8 | - | - |
| 300,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 263,489 | 999,300 |
| **325,000,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **314,458,492** | **324,442,824** |
| | **මූලධන වියදම්** | | | |
| 20,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 16,477,069 | 9,558,993 |
| 550,000,00 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 309,550 | 29,890 |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - |
| 1,000,000 | හැකියා වර්ධනය | 14 | 531,770 | 162,500 |
| 366,800,000 | වෙනත් මූලධන වියදම් | 15 | 231,271,252 | 156,016,255 |
| **388,350,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **248,589,641** | **165,767,638** |
| | තැන්පතු ගෙවීම් | | 24,842,386 | 39,985,553 |
| | අත්තිකාරම් ගෙවීම් | | 12,930,813 | 12,403,105 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **37,773,199** | **52,388,658** |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **600,821,332** | **542,599,120** |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(61,047,659)** | **(52,315,755)** |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | **(61,047,659)** | **(52,315,755)** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | |
| | | | **(61,047,659)** | **(52,315,755)** |

## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**2023 දෙසැම්බර් 31 දිනට**

| | සටහන | නත්‍ය | |
|---|---|---|---|
| | | 2023 රු. | 2022 රු. |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීවී-6 | 683,355,595 | 612,801,770 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීවී-5/5(ඒ) | 38,385,103 | 37,328,944 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීවී-3 | - | - |
| **මුළු වත්කම්** | | **721,740,698** | **650,130,714** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 27,424,359 | 25,026,833 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 683,355,595 | 612,801,770 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීවී-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීවී-4 | 10,960,744 | 12,302,111 |
| අග්‍රිම ශේෂය | ඒසීවී-3 | - | - |
| **මුළු වගකීම්** | | **721,740,698** | **650,130,714** |

පිටු අංක 1 සිට 24 දක්වා ඒසීවී 2 සිට ඒසීවී 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 25 සිට 31 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : ඩබ්ලිව්.එස්.සත්‍යානන්ද

තනතුර : ලේකම්, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

දිනය : 2023/02/20

ඩබ්ලිව්.එස්. සත්‍යානන්ද
SLAS (SPECIAL GRADE)
MBA(Ballarat), PGD(La-Trobe), B.Sc.(Sri Jayawardenepura)
ලේකම්
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
17 වන මහල, "සුහුරුපාය"
බත්තරමුල්ල

.....
ගණන්දීමේ නිලධාරි
නම : ඉංජි.ආර්.ඒ.එස්.රණවක

තනතුර : අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරණ

දිනය : 2023/02/13

ඉංජි. ආර්. ඒ. එස්. රණවක
අධ්‍යක්ෂ ජනරාල්
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
4 වන මහල, නව මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ 10.

.....
ප්‍රධාන ගණකාධිකාරි
නම : කේ. තිරුකුමාර්
තනතුර :ප්‍රධාන ගණකාධිකාරී, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව
දිනය : 2023/02/13

කේ. තිරුකුමාර්
ප්‍රධාන ගණකාධිකාරි
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත, කොළඹ 10.

## 3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | තත්‍ය | |
|---|---|---|
| | 2023<br>රු. | 2022<br>රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | 315,017 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 59,195,936 | 60,674,141 |
| අග්‍රිම ලැබීම් | 504,398,000 | 469,617,221 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 11,247,993 | 10,007,549 |
| තැන්පතු ලැබීම් | 23,501,019 | 10,715,382 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **598,342,948** | **551,329,310** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 306,451,872 | 322,479,787 |
| සහනාධාර සහ මාරුකිරීම් | 2,910,014 | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 2,708,221 | 10,738,227 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | - |
| අත්තිකාරම් ගෙවීම් | 12,930,813 | 12,403,105 |
| තැන්පතු ගෙවීම් | 24,842,386 | 39,985,553 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **349,843,306** | **385,606,672** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | **248,499,642** | **165,722,638** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **-** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 248,499,642 | 165,722,638 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **248,499,642** | **165,722,638** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(248,499,642)** | **(165,722,638)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)** | **-** | **-** |

## 3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | තත්‍ය | |
|---|---|---|
| | 2023<br>රු. | 2022<br>රු. |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)** | **-** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)+(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

## පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

**ඇමුණුම - (i)**

**(මු.රෙ. 106 හා මූ.රෙ. 113 යටතේ වන පාඩු)**

**වියදම් ශීර්ෂ අංකය : 291**

**දෙපාර්තමේන්තුවේ නම : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ**

**වැඩසටහන් අංකය හා නාමය : 01 - මෙහෙයුම් වැඩසටහන**

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

| අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|
| රු. 25,000.00 | අඩු | 04 | 48,169 |
| රු. 25,000.01 | වැඩි | 03 | 300,320 |
| **එකතුව** | | **07** | **348,489** |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1. යන්ත්‍ර හා උපකරණ අනතුරු | 07 | 348,489 |
| 2. | | |
| 3. | | |
| **එකතුව** | **07** | |

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

| අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|
| රු. 25,000.00 | අඩු | 01 | 21,058 |
| රු. 25,000.01 | වැඩි | | |
| **එකතුව** | | **01** | **21,058** |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1. යන්ත්‍ර හා උපකරණ අනතුරු | 01 | 21,058 |
| **එකතුව** | **01** | **21,058** |

(ii) අනුව කාල විශ්ලේෂණය

| | | |
|---|---|---|
| වසර 5 ට අඩු | සිද්ධි සංඛ්‍යාව | 01 |
| | ගණන | රු. 21,058 |
| වසර 5-10 | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |
| වසර 10 ට වැඩි | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මූ.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

ප්‍රධාන ගණකාධිකාරි

දිනය :

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

## පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය

ඇමුණුම - (ii)

**වියදම් ශීර්ෂ අංකය : 291**

**දෙපාර්තමේන්තුවේ නම : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ**

**වැඩසටහන් අංකය හා නාමය : 01 - මෙහෙයුම් වැඩසටහන**

1 වර්ෂය තුළ සිදුවූ මූ.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

| අගය | සිද්ධි සංඛ්‍යාව | වටිනාකම (රු) |
|---|---|---|
| (i) රු. 25,000.00 අඩු | 04 | 48,169 |
| (ii) රු. 25,000.01 වැඩි | 02 | 215,320 |
| **එකතුව** | **06** | **263,489** |

2 වර්ෂය තුළ මූ.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය

| අලාභයේ ස්වභාවය | | ආරම්භක කපා නොහල ශේෂය රු. | අලාභයේ වටිනාකම රු. | අයකර ගැනීම් රු. | පොතෙන් කපා හල අගය රු. | කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු. | පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1. Hyundai Excavator | යන්ත්‍ර හා උපකරණ අනතුරු | 4,349 | - | - | 4,349 | - | JE230101 |
| 2. Hyundai Excavator | යන්ත්‍ර හා උපකරණ අනතුරු | 54,320 | - | - | 54,320 | - | JE230101 |
| 3. Hitachi Excavator | යන්ත්‍ර හා උපකරණ අනතුරු | - | 21,000 | - | 145,800 | - | JE230202 |
| 4. Welding Generator | යන්ත්‍ර හා උපකරණ අනතුරු | - | 85,000 | 85,000 | - | - | |
| 5. Hyundai Excavator | යන්ත්‍ර හා උපකරණ අනතුරු | - | 6,920 | - | 6,920 | - | JE230202 |
| 6. Hitachi Excavator | යන්ත්‍ර හා උපකරණ අනතුරු | - | 15,900 | - | 15,900 | - | JE23020 |
| 7. Hyundai Excavator | යන්ත්‍ර හා උපකරණ අනතුරු | - | 161,000 | - | 161,000 | - | JE231204 |
| 8. GJ 7326 Vehicle | වාහන අනතුරු | - | 21,058 | - | - | 21,058 | JE220102 |
| **එකතුව** | | **58,669** | **310,878** | **85,000** | **263,489** | **21,058** | |

ප්‍රධාන ගණකාධිකාරි

දිනය :

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

**දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය**

**සටහන - (iii)**

**වියදම් ශීර්ෂ අංකය : 291**

**දෙපාර්තමේන්තුවේ නම : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ**

**වැඩසටහන් අංකය හා නාමය : 01 - මෙහෙයුම් වැඩසටහන**

**නැත**

## බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i)

ඇමුණුම - (iv)

**මු.රෙ. 94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය**

**වියදම් ශීර්ෂ අංකය : 291**

**දෙපාර්තමේන්තුවේ නම : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ**

**වැඩසටහන් අංකය හා නාමය : 01 - මෙහෙයුම් වැඩසටහන**

| පුද්ගලයාගේ/ආයතනයේ නම | බැඳීම් පිළිබඳ විස්තරය | ව්‍යාපෘතිය | උප ව්‍යාපෘතිය | වැය ශීර්ෂය සංකේතය | මූල්‍යකරණ සංකේතය | මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.) | මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.) | බැඳීම් හා බැරකම් වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| 1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු | | | | | | | | |
| 2. ලේකම්, ධීවර අමාත්‍යාංශය | කාර්යාල සනීපාරක්ෂක සහ ආරක්ෂක සේවා | 1 | 0 | 1409 | 11 | | | 3,289,714 |
| 3. ලේකම්, ධීවර අමාත්‍යාංශය | විදුලිය හා ජලය | 1 | 0 | 1403 | 11 | | | 657,228 |
| 4. ලේකම්, ධීවර අමාත්‍යාංශය | විදුලි සෝපාන නඩත්තු | 1 | 0 | 1302 | 11 | | | 9,648 |
| 5. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය | අතිකාල දීමනා | 1 | 0 | 1002 | 11 | | | 2,459,611 |
| 6. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය | ගමන් වියදම් දීමනා | 1 | 0 | 1101 | 11 | | | 1,625,623 |
| **එකතුව** | | | | | | | | **8,041,824** |
| | | | | | | | | |
| **මුළු එකතුව** | | | | | | | | **8,041,824** |

ප්‍රධාන ගණකාධිකාරී

දිනය :

**2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි** **ඇමුණුම - (viii)**

**උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ**

**2023.12.31 දිනට තත්ත්ව වාර්තාව**

**වියදම් ශීර්ෂ අංකය : 291** **දෙපාර්තමේන්තුවේ නම : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ**

| අනු අංකය | බැංකුවේ නම | ගිණුම් අංකය | 2023.12.31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය (රු.) | 2023.13.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.) | 2023.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්) | අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය |
|---|---|---|---|---|---|---|
| 01 | ලංකා බැංකුව<br>තැප්‍රොබේන් ශාඛාව | 0007042641 | 32,640,914 | - | - | දෙසැම්බර් 2023 |
| 02 | ලංකා බැංකුව<br>තැප්‍රොබේන් ශාඛාව | 0007040117 | 0 | - | - | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

ප්‍රධාන ගණකාධිකාරී
දිනය :

## 3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. 000

| ආදායම් කේතය | ආදායම් සංග්‍රහයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසාන ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2003-02-99 | පරිපාලන ගාස්තු සහ ගාස්තු | 4,650.00 | 4.650.00 | 4,405.00 | 94.7 |
| 2002-02-99 | පොලී-වෙනත් | 1,500.00 | 1,500,00 | 1,557.00 | 103.8 |

## 3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රති | අවසාන | | |
| පුනරාවර්තන | 325,000 | 325,000 | 325,000 | 96.77 |
| ප්‍රාග්ධන | 388,350 | 388,350 | 248,589 | 64.01 |

## 3.8 වෙනත් අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන නොලැබුණි

අදාළ නැත.

## 3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

| වත්කම් කේතය | කේත විස්තරය | සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය 31/12/2023 | 2023/12/31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාවට අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 217,098 | 217,098 | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ හා ප්‍රවාහන | 331,841 | 331,841 | - | - |
| 9153 | ඉඩම් | 119,888 | 119,888 | - | - |
| 9154 | අස්පෘෂ්‍ය වත්කම් | 14,528 | 14,528 | - | - |

## 3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එජඩබළ/ඩී/සිසි&සිඅර්එමඩි/එජ්ජ්/01/2023/56
ඔබගේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2024 ජූනි 13 දින

අධ්‍යක්ෂ ජනරාල්
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම කෙටුම්පත් විගණන වාර්තාවේ නිරීක්ෂණවලට දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීමෙන් පසුව මතය ප්‍රකාශ කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

### 1.2 මතය සඳහා පදනම

මෙම කෙටුම්පත් විගණන වාර්තාවේ නිරීක්ෂණවලට දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීමෙන් පසුව මතය ප්‍රකාශ කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වල මුදල් ගලායාම යටතේ "මූල්‍යනය වියදම්" වශයෙන් සඳහන් කළයුතු රු.248,499,642ක් "භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්" වශයෙන් සඳහන් කර තිබීමෙන් ගිණුම් ආකෘතියට අනුකූල නොවන බව නිරීක්ෂණය විය.

### 1.6.2 අත්තිකාරම් ගෙවීම්

(අ) සේවක ණය අත්තිකාරම් ලෙස ලබා දී තිබූ මුදලින් 2023 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවීමට පැවති රු.74,356.05 ක් හා දෙපාර්තමේන්තුව හැර ගිය නිලධාරීන් ගෙන් අයවීමට පැවති රු. 303,061 ක් වර්ෂ 1 ත් 3 ත් අතර කාලයක් තිහතිවිව පැවති අතර ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4 ඡේදය ප්‍රකාරව කටයුතු කර ඒවා අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2021 හා 2023 වර්ෂය තුළ සේවය හැරගොස් තිබුණු නිළධාරීන් හතර දෙනෙකුට වැටුප් හා දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබූ එකතුව රු.189,535 කින් නිළධාරීන් දෙදෙනෙකුගෙන් අයකරගත යුතු රු. 77,126 ක් අයකර ගැනීම සඳහා ලිපි යොමුකර තිබූ නමුත් අනිකුත් නිළධාරීන් දෙදෙනෙකුගෙන් අයවීමට තිබූ රු. 112,409 ක් අයකර ගැණීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 1.6.3 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

(අ) "අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්ථාකරණ ආයතන විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම්" රු. 937,840 ක් "අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම්" වශයෙන් **අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ** සඳහන් කර තිබුණි.

(ආ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව, අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්ථාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම් රු. 59,195,935 ක් හා දරන ලද වියදම් රු. 2,708,221ක් වුවද, එම ශේෂයන් අග්‍රිම ගැලපුම් ප්‍රකාශනයෙහි පිළිවෙලින් රු. 42,932,026 ක් හා රු. 2,182,012ක් වශයෙන් දක්වා තිබුණි.

(ඇ) 2023 නොවැම්බර් 30 දිනැති අංක 2023/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි අග්‍රිම ගැලපුම් ප්‍රකාශයේ ආකෘතිය හා ඇතුළත් කළ යුතු තොරතුරු පෙන්වාදී අවශ්‍ය පරිදි අනෙකුත් කරුණු ද ඇතුළත් කරන ලෙස සඳහන් කර තිබුණ ද, අග්‍රිම ගැලපුම් ප්‍රකාශයට නොගැලපිය යුතු තැන්පතු ගිණුම් (හරස් සටහන්) ලැබීම් රු. 8,859,698 ක්, ගෙවීම් රු. 1,014,366 ක් හා වාර්ථාකරණ ආයතනය විසින් වෙක්පත් අවලංගු කර වැය විෂයයන් අධිභාර කිරීම් රු.316,520 ක් ද අග්‍රිම ගැලපුම් ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි.

### 1.6.4 මූල්‍ය නොවන වත්කම්

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් වර්ගීකරණ උපලේඛනයේ ජර්නල් අංකය සමඟ වත්කම් වටිනාකම පමණක් සඳහන් කර තිබූ නමුත් ඊට අදාළ වත්කම් නාමය සඳහන් කර නොතිබීම හේතුවෙන් වත්කම් අයිතම හඳුනාගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ මඩකලපුව හා හම්බන්තොට ප්‍රදේශීය ඉංජිනේරු කාර්යාල පිහිටි ඉඩම්වල අයිතිය පැවරීමේ සහතික ලැබී තිබුණ ද ඒවා තක්සේරු කර එම වටිනාකම් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) හලාවත ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිති ගොඩනැගිල්ලෙහි අයිතිය දෙපාර්තමේන්තුවට ලබා නොගෙන 2022 වර්ෂයේ රු.2,800,000 කට තක්සේරු කර මූල්‍ය නොවන වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබීමේ වරද සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමේ දී කාර්යාල ගොඩනැගිල්ලේ ආරම්භක ශේෂය නිවැරදි කිරීම වෙනුවට වත්කම් ඉවත් කිරීමක් ලෙස ගැලපුම් කර තිබුණි. එම වරද නිවැරදි කිරීම සඳහාත්, දේපළෙහි අයිතිය දෙපාර්තමේන්තුව වෙත පැවරෙන තෙක් එය හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම්වලට ඇතුළත් කර ගැනීම සඳහාත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දැනුවත්කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් යටතේ රු.42,007,000 කට තක්සේරු කර දක්වා ඇති හෙක්ටයාර් 0.7941 ක ප්‍රමාණයේ ඉඩම් 03 ක අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) රක්ෂණය කිරීම සඳහා පමණක් යොදාගන්නා ලෙස දන්වමින් පහත සඳහන් වාහන 10 ක් සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලද රු.34,300,000 ක තක්සේරු වටිනාකම, ගිණුම්ගත කිරීමට හා ලේඛනගත කිරීමට යොදාගත හැකිද යන්න පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නොවිමසා එම වටිනාකම් ගිණුම්වලට ඇතුළත් කර තිබුණි.

(ඊ) ගොඩවාය නිවාඩු නිකේතනයේ රු.15,000 ක් වටිනා MA- 8434 (Bajaj) යතුරුපැදියක් සහ රු. 40,000 ක නැවත තක්සේරු කරන ලද අංක රහිත යතුරු පැදියක් ලෙස යතුරුපැදි දෙකක් වාහන උපලේඛනයේ ඇතුළත් කර තිබූණ ද භෞතිකව එක් යතුරුපැදියක් පමණක් පැවතීම විගණනයේ දී ගැටලු සහගත විය.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයේ දෙපාර්තමේන්තුවට හිමි යතුරුපැදි 17 කින් යතුරුපැදි 08 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන මඟින් 2022 ඔක්තෝම්බර් 06 වන දින දෙපාර්තමේන්තුව වෙත පවරන ලද යතුරු පැදි දෙකක් ද ඊට ඇතුළත් විය.

(ඌ) ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල සහ නිවාඩු නිකේතනවලට අනුයුක්ත කර තිබූ වාහන 11ක් අලුත්වැඩියා හා සුලු දෝෂ තත්ත්වයන් මත වර්ෂ 2 කට ආසන්න කාලයක් ධාවනයෙන් ඉවත් කර තිබුණු අතර එම වාහන අලුත්වැඩියා කර ධාවන තත්වයට පත්කර ගැනීමට හෝ ධාවනයට නුසුදුසු නම් අපහරණ ක්‍රියාවලිය සඳහා යොමුකිරීමට හෝ කටයුතු නොකර අදාළ පරිශ්‍රයන්හි ගාල් කර දිරාපත් වීමට ඉඩහැර තිබුණි.

(එ) ව්‍යාපෘති කාර්යයන් සඳහා මොරටුව හා මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවලට අනුයුක්ත කර ඇති යන්ත්‍රෝපකරණ හතරක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

ලංකා මිනරල් සැන්ඩ් ලිමිටඩ් ආයතනය වෙත 2007 වර්ෂයේ සිට 2020 සැප්තැම්බර් 03 දක්වා කාලපරිච්ඡේදය තුළ ලබා දුන් බලපත්‍ර 04 කට හා 2020 සැප්තැම්බර් 07 සිට 2021 සැප්තැම්බර් 06 දක්වා කාලයට නිකුත් කරන ලද බලපත්‍රය මත එම ආයතනය අනුමත කළ වැලි කියුබ් ප්‍රමාණය ඉක්මවා වැඩිපුර සිදුකළ කැණීම් සඳහා අයවිය යුතු පිළිවෙලින් රු.72,895,000 ක හා රු1,688,515 ක ගාස්තුව අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. නමුත් ලංකා මිනරල් සැන්ඩ් ලිමිටඩ් ආයතනය විසින් රු.64,056,000 ක් පමණක්

දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල ලෙස ගණනය කර එම මුදල වර්ෂ 5 ක් තුළ ගෙවීම් කිරීමට කටයුතු කරන බව දන්වා තිබීම විගණනයට ගැටළු සහගත විය.

**2.2 වියදම් කළමනාකරණය**

වැය විෂය අංක 2104 මූලධන වත්කම් අත්පත් කරගැනීම යටතේ 2023 වර්ෂයේ ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා වෙන්කළ රු.150,000 ක ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් ඉතිරි කර තිබුණි.

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව 2023 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් වැය විෂයයන් 04ක් සඳහා රු.10,948 ක ඉතිරිව ඇති මුදල ඉක්මවා රු.5,582,213 ක බැරකම් ඇතිකරගෙන තිබුණි.

**2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණු නමුත්, ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ ඉදිරිපත් කළ එම සමාලෝචනයන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් "2022.08.08 දිනැති අංක DMA – 02/2022 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ අනුව එය අවලංගු කර ඇති බව දන්වා"සහතික නොකර ආපසු එවා තිබුණි.

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 214 | අවශ්‍ය විස්තරාත්මකව තොරතුරු ඇතුළත් කරමින් බැදීම් හා බැරකම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ට අදාළව 2020 | ඇස්තමේන්තුගත වියදම පිළිවෙලින් රු.මි. 17 ක් හා රු.මි. 18 ක් වූ මොරටුව ලුනාව වෙරළ තීරයේ වෙරළ බාදනය වැළැක්වීම පිණිස මීටර් 410 ක් දිග රිවට්මන්ට් බැම්ම සහ |

| | | |
|---|---|---|
| | මාර්තු 25 දිනැති අංක 35 දරන අතිරේකය | කළුතර වෙරළ තීරයේ මීටර් 200 ක් දිග රිවට්මන්ට් බැම්ම පියවර I ඉදිකිරීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ කළුගල් වෙළෙඳපොල මිල සැසඳුම් ක්‍රමය යටතේ ලබා ගැනීම සඳහා 2022 ඔක්තෝම්බර් මස හා 2021 ජූනි සිදු කළ මිල ගණන් කැඳවීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවක් හරහා සිදුකරගත යුතු වුවද එය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් හරහා සිදුකර කරගෙන තිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කි.මී. 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ වාහන 28 ක් හා යන්ත්‍ර 18 ක් සම්බන්ධයෙන් එලෙස ඉන්ධන පරීක්ෂා කර නොතිබුණි. |
| (ඈ) | 2021 අගෝස්තු 06 දිනැති අංක 01/2021 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛයේ 9 හා 10 ඡේද | ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිළධාරී, කළමණාකරණ සේවා නිළධාරී, රියදුරු, කාර්යාල කාර්ය සහයක සේවාවන්හි නිලධාරීන් 90 දෙනෙකුට වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් කටයුතු නොකිරීමෙන් මෙම දෙපාර්තමේන්තුවේ වර්ෂ 5 ක සිට වසර 15කට වඩා දීර්ඝ කාලයක් ද, එයින් 37 දෙනෙක් වසර 15 ට වැඩි කාලයක් ද රාජකාරිය ඉටු කරමින් සිටින බව නිරීක්ෂණය විය. |
| (ඉ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 13 ඡේදයෙන් සංශෝධිත මු.රෙ.770(3) | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්ථා මත පදනම්ව ප්‍රදේශීය ඉංජිනේරු කාර්යාල 08 ක අපහරණය කළ භාණ්ඩ විනාශ කිරීම සඳහා ස්වාධීන රාජ්‍ය නිලධාරියෙකුගේ වාර්තාවක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ගාල්ල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ හා මාදුගඟ නිවාඩු නිකේතනයෙන් අපහරණය කළ අයිතම 16 ක් පොත් වලින් කපා හැරීම සඳහා ගණන්දීමේ නිළධාරියාගේ අනුමැතිය ලබාගැනීමට ද කටයුතු කර නොතිබුණි. |

**2.6 බැංකු ගිණුම් පිළිබඳ තත්ත්ව පරීක්ෂා කිරීම**

ලංකා බැංකු ගිණුමේ 2023 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනය අනුව රු.3,000 ක ශේෂයක් පවතිය ද, මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ 2023 දෙසැම්බර් 31 දිනට තත්ත්ව වාර්ථාවේ ශේෂයක් සඳහන් කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන් 29 අතුරින් ඇස්තමේන්තුගත වියදම් රු.මිලියන 165ක කාර්යයන් 07 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.1.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

(අ) 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ පනතේ 7 (ඉ) හා 12 වගන්ති සහ 2018 වසරේ සංශෝධිත උපදේශක සභාව විසින් අනුමත කරන ලද වෙරළ කළමනාකරණ සැලැස්මේ 6.4.6 ඡේදය ප්‍රකාරව උපදේශක සභාවට බලපත්‍ර නිකුත් කිරීමේ බලයක් නොමැති අතර පොදු කටයුතු සඳහා පස සිටුවෙන් නිදහස් වීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීමට හැකියාව ඇති නමුත් පස සිටුවෙන් නිදහස් ව පෞද්ගලික කටයුතු සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ ලබා දී තිබූ බවට නිරීක්ෂණය විය. තවද, සංවර්ධන කාර්යය සඳහා වෙනත් විකල්පයක් නොමැති අවස්ථාවක දී පමණක් ඉදිකිරීම් රහිත ප්‍රදේශයක් වන "වෙන්කළ ප්‍රදේශය" මහජනතාවගේ පෞද්ගලික නොවන පොදු සංවර්ධන කාර්යයන් සඳහා පමණක් වෙරළ පස සිටුවෙන් නිදහස් කිරීම අනුමත කිරීම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාට කළ හැකි නමුත් 2021 දෙසැම්බර් සිට 2023 ඔක්තෝබර් දක්වා කාලය තුළ පවත්වන ලද උපදේශක සභා රැස්වීම් වාරයන්හි දී වෙන් කරන ලද ප්‍රදේශයන් තුළ පෞද්ගලික අයදුම්පත් 81 කට ඉදිකිරීම් සඳහා විරුද්ධත්වයක් නොමැති බවට ලිපි සමඟ බලපත්‍ර ලබා දී තිබූ බවට නිරීක්ෂණය විය. ඒ අනුව බලපත්‍රයක් ලබාදීමෙන් අපේක්ෂිත වෙරළ කලාපය තුළ සංවර්ධන කටයුතු මඟින් සිදුවන අහිතකර බලපෑම් වැළැක්වීම හෝ අවම කිරීම යන අරමුණට අනුකූල නොවන බව නිරීක්ෂණය විය.

(ආ) හම්බන්තොට, හලාවත, මීගමුව, මාතර හා මොරටුව යන ප්‍රාදේශීය කාර්යාල මඟින් හඳුනාගන්නා ලද අනවසර ඉදිකිරීම් සඳහා 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ නිකුත් කර තිබුණු කඩා ඉවත් කිරීමේ නියෝග 1064 කින් 787 ක් හෙවත්

සියයට 74 ක් සඳහා කඩා ඉවත් කිරීම හෝ වෙනත් විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එලෙස කඩා ඉවත් කිරීම් නියෝග ලබා දී තිබූ ඉදිකිරීම් 05 කට පමණක් බලපත්‍ර නිකුත්කර තිබුණි. එම කඩා ඉවත් කිරීම් වෙනුවෙන් දෙපාර්තමේන්තුව වැය කර තිබූ රු.3,601,256 කින් රු.3,029,030 ක් අදාළ පාර්ෂව වෙතින් අයකරගනීමට ද නොහැකි වී තිබුණි.

(ඇ) මාර්ගගත ක්‍රමය ඔස්සේ බලපත්‍ර ලබාදීම 2019 පෙබරවාරි 22 වන දින සිට ආරම්භ කර තිබූ නමුත් පද්ධතියෙන් බැහැරව අතින් බලපත්‍ර නිකුත් කිරීමත්, ස්ථානීය පරීක්ෂාවන් සිදුකිරීමට සැලකිය යුතු කාලයක් ගත වී තිබීමත්, යන කරුණු අනුව පද්ධතිය ස්ථාපිත කිරීමෙන් අපේක්ෂිත බලපත්‍ර නිකුත් කිරීමේ කාලය අඩු කිරීම යන අරමුණ ඉටුවී නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයේදී ඇතිවූ ගංවතුර තත්ත්වය පාලනය සඳහා පිළියමක් ලෙස කළුගඟ ගංමෝය කට පුලුල් කිරීම නිසා කළුතර අවට වෙරළ බාදනය දැඩි ගැටලුවක් බවට පත්වී ඇත. එම මුහුදු බාදනය නැවැත්වීමේ පිළියමක් ලෙස 2017 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘති කාර්යන් 19 ක් රු.මි. 189 ක් වැයකර සිදුකර තිබුණ ද මේ ගැටලුව සඳහා ස්ථීර පිළියමක් ලැබී නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) දෙහිවල හා ගල්කිස්ස වෙරළ කලාපයේ අනවසරයෙන් ඉදිකර පවත්වාගෙන යනු ලබන අවන්හල් 20 ක් බලපත්‍ර ලබා නොගෙන විශාල වශයෙන් ආදායම් උපයන බවට නිරීක්ෂණය විය. එයින් එක් අවන්හලක් දෙපාර්තමේන්තුවේ මොරටුව ප්‍රාදේශීය කාර්යාලය මඟින් හඳුනාගෙන නොතිබූ අතර අවන්හල් පහළොවක් සඳහා පොලීසියට පැමිණිලි කිරීමට ද කටයුතු කර නොතිබුණි. තවද, අවන්හල් පහක් සඳහා කඩා ඉවත් කිරීමේ නියෝග නිකුත් කර නොතිබූ අතර කඩා ඉවත් කිරීමේ නියෝග නිකුත් කර තිබූ අවන්හල් පහළොව අඛණ්ඩව සිදුකරමින් පවතින සංවර්ධන කාර්යයන් කෙරෙහි දෙපාර්තමේන්තුවෙන් නිසි අවධානය යොමුවී නොතිබුණි. මූලික අදියරයේදීම හඳුනාගෙන නීත්‍යානුකූලව ඉවත්කිරීමට පියවර ගෙන නොතිබීමෙන් දෙපාර්තමේන්තු විසින් පනවන කඩා ඉවත් කිරීමේ නියෝග නාමික නියෝගයක් පමණක් වී තිබූ බව නිරීක්ෂණය විය.

### 3.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

(අ) මොරටුව ලුනාව වෙරළ බාදනය වැළැක්වීම පිණිස මීටර් 100 ක් පමණ දිගට ඉදිකර තිබූ රිවට්මන්ට් බැම්ම මීටර් 300 ක් දක්වා දික් කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර හා අමුද්‍රව්‍ය මිලදීගැනීමට 2021 වර්ෂය ආරම්භයේදී රු. 24,999,825 කට ඇස්තමේන්තු කර

වර්ෂය අවසානයේදී බැම්ම මීටර් 410 ක් දක්වා දික් කර ඇස්තමේන්තුව රු.36,287,012 ක් දක්වා වැඩිකර තිබුණු අතර මෙම බැම්ම දික් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සනාථ නොවුණි. වෙරළ ආශ්‍රිත නිවාස 38 ක් සම්බන්ධයෙන් පැවති ගැටළුකාරී තත්ත්වය සමනය කර නොගැනීම මත මෙම ඉදිකිරීම ආරම්භ කිරීමට ප්‍රමාද වීම, දුම්රිය දෙපාර්තමේන්තුවට රු.3,567,321 ක මුදලක් ගෙවා අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට භාවිතා කරන ලද දුම්රිය හරස් මාර්ගයට නිසි පරිදි කොඩිකරුවන් නොයෙදවීම හා ද්‍රව්‍ය සැපයුම් ප්‍රමාදවීම වැනි හේතූන් මත 2021 නොවැම්බර් 11 දින අවසන් කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඇස්තමේතුගත පිරිවැය රු.65,919,292 ක් දක්වා වැඩි වී තිබුණි.

(ආ) 2012 සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ කඩා ඉවත් කිරීම් නියෝග නිකුත් කළ අනවසර ඉදිකිරීම් 2427 කින් අනවසර ඉදිකිරීම් 2247ක් ඉවත් කිරීමටත්, 2023 ඔක්තෝම්බර් 31 දක්වා දිස්ත්‍රික්ක 12 ක අනවසර ඉදිකිරීම් ලෙස හඳුනාගෙන ක්‍රියාමාර්ග ගැනීමට තිබූ මුලු අනවසර ඉදිකිරීම් 566 කින් 340 ක් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 සිට 2023 දක්වා කඩා ඉවත් කිරීම් නියෝග නිකුත් කර තිබූ අනවසර ඉදිකිරීම් වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතුව තිබුණු රු.3,853,006 කින් සියයට 85 වන රු 3,280,780 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) මීගමුව කාර්යාලය මඟින් බලපත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරන ලද බවට පද්ධතිය තුළ දක්වා තිබූ අයදුම්පත්‍ර 100 ක් අතුරින් අයදුම්පත්‍ර 53 ක් සඳහා බලපත්‍ර හා විරෝධතාවයක් නොමැති බව සඳහන් කළ ලිපි නිකුත් කිරීමට හේතු දක්වා නොතිබුණු අතර එකම අයදුම්පත්‍රය සඳහා යොමු අංක කිහිපයක් යටතේ ප්‍රතික්ෂේප වීම හෝ බලපත්‍ර නිකුත් කළ බවට සටහන්ව තිබුණි.

(ආ) සංවර්ධන කාර්යයක් සඳහා බලපත්‍රයක් මාර්ගගත තොරතුරු පද්ධතිය මඟින් අයදුම් කිරීමේදී ඇතුළත් කරනු ලබන ඡායාරූප වල ඉඩදෙනු ලබන MB ප්‍රමාණය ඉක්මවා යෑම, වෙරළේ සිට ඇති දුර ප්‍රමාණය දශමස්ථාන සහිතව ඇතුළත් කිරීම වැනි පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීමේදී පෙන්නුම් කරනු ලබන දෝෂ පණිවිඩ (Error Message) හඳුනාගැනීමට හෝ විකල්ප ක්‍රම පෙන්වා නොදීමෙන් මාර්ගගත ක්‍රමය මඟින් අයදුම් කිරීම සිදුකර ගැනීමට නොහැකි වී ඇති අවස්ථා නිරීක්ෂණය විය.

(ඇ) මාර්ගගත තොරතුරු පද්ධතිය මඟින් අදාළ තොරතුරු පද්ධතියට ඇතුළත් කළ පසු අයදුම්පත්‍රයට අදාළ යොමු අංකයක් ලබා ගැනීමට නොහැකි වීම නිසා අයදුම්කරුවන් එක් බලපත්‍රයක් වෙනුවෙන් අයදුම්පත් කිහිපයක් ඇතුළත් කර ඇති බවට නිරීක්ෂණය විය.

(ඈ) වෙරළ පරිසරයට හානිදායක නොවන පරිදි ඉදිකිරීමට අවසර ලබා දීම බලපත්‍රයක් නිකුත් කිරීමේ ප්‍රධාන අරමුණ වුවද, තීරණ ගැනීමේ දී මුහුදු සීමාව හා ඉදිකිරීම සිදුකරනු ලබන දුර මාර්ගගත තොරතුරු පද්ධතිය හරහා ලබා ගත නොහැකි බවට නිරීක්ෂණය විය.

(ඉ) මාර්ග ගත පද්ධතියේ ඇතුළත් කර ඇති තොරතුරු(Information Data Base) එම පද්ධතියේ සැකසුම්කරු සතුව පැවතීම හේතුවෙන් දත්තවල රහස්‍යභාවය සම්බන්ධයෙන් ගැටලුවක් මතුවිය හැකි බවටත්, අවශ්‍ය වාර්තා කටයුතු සඳහා එම දත්ත ආයතනයට අවශ්‍ය වාර්තා ලබා ගැනීමට නොහැකි බවටත් නිරීක්ෂණය විය.

### 3.1.5 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

කළුතර කැලිඩෝ වෙරළ තීරයේ වෙරළ බාදනය හා ඒ අසල ඇති මාර්ගය වෙත වැලි පිරීම වැලැක්වීම සඳහා රිවට්මන්ට් බැම්මක් ඉදිකිරීමට අවශ්‍ය ටොන් 20 එස්කැවේටර් යන්ත්‍රයකින් යන්ත්‍ර පැය 650 ක් සහ කියුබ් 01 ලෝඩර් යන්ත්‍රයකින් පැය 300 ක සේවාව සපයා ගැනීම පිණිස 2021 ජූනි කැඳවා වර්ෂය අවසානයේ ගිවිසුම්ගත වූ සැපයුම්කරුවන් වෙත පිළිවෙලින් පැය 213.5 ක් සඳහා රු.1,184,925 ක් හා පැය 49.3 ක් සඳහා රු.322,915 ක් ගෙවා තිබූ නමුත් ඊට අදාළව සිදුකළ කාර්යයන් පිළිබඳව විගණනයේ දී සනාථ නොවුණු අතර වැඩබිමේ කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම මත එම කාර්යය අතරමඟ නිලධාරීන්ගේ අවසරය සහිතව සැපයුම්කරුවන් විසින් වැඩබිමෙන් යන්ත්‍ර ඉවත්කරගෙන තිබුණි. ඒ අනුව වැඩබිමේ ඉතිරි වැඩ සඳහා 2023 වර්ෂයේ දී රු.39,724,498 කට සකස් කළ ඇස්තමේන්තුව මත රු.1,814,790 ක් වැඩිපුර ගෙවීමට සිදුවන බවටත්, නැවත මිල ගණන් කැඳවීමෙන් ලබාගත් හිතාවි 330 එස්කැවේටර් යන්ත්‍රය ද නිතර අක්‍රීය වීම හේතුවෙන් අනෙකුත් යන්ත්‍ර භාවිතා කිරීමට නොහැකි වීම මත 2023 ජූලි සිට අගෝස්තු 11 දින දක්වා අක්‍රීය කාලය සඳහා පමණක් රු.1,756,280 ක් ගෙවීමට සිදුවන බවටත්, නිසි අධීක්ෂණයකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද වැඩබිමේ කටයුතු අක්‍රීය තත්ත්වයේ පවතින බවටත් නිරීක්ෂණය විය.

### 3.1.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින්

ඉදිරිපත් කළ කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ පරිච්ඡේදය 3 හා 7 ප්‍රකාරව වර්ෂයේ සමස්ත මූල්‍ය කාර්යසාධනය හා අනුකූලතා වාර්තාව ඇතුළත්වී නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු. මිලියන 11.9 ක් වූ Volvo Excavator රථය වසර ගණනාවක් තිස්සේ භාවිතයට නොගෙන ගාල්ල කාර්යාල පරිශ්‍රයේ දිරාපත්වෙමින් පැවති අතර වටිනාකම රු. 5,800,000 ක් වූ 2021 නොවැම්බර් 16 වන දින වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත භාර දී තිබුණු අංක PD-1046 දරන TOYOTA HILUX ඩබල් කැබ් රථයේ අයිතිය පැවරීමට හෝ එම වාහනය දෙපාර්තමේන්තුව වෙත නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මොරටුව ප්‍රාදේශීය කාර්යාලයේ භිතාවි 330 හා හයිඋන්ඩායි 320 එස්කැවේටර් යන්ත්‍ර දෙකක් දීර්ඝ කාලයක සිට භාවිතා නොකර නවතා දමා තිබීමෙන් ධාවනය කළ නොහැකි තත්ත්වයට පත්ව තිබූ නමුත් මේ පිළිබඳව වගකිවයුතු නිළධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

(අ) ව්‍යාපෘතිය සඳහා ටොන් 20 ක් හා ටොන් 12 ක් බැගින් වන එස්කැවේටර් යන්ත්‍ර 02ක් කුලියට ගැනීම සඳහා තෝරාගත් සැපයුම්කරු විසින් කොමටිසු පී සී 120 දරන ටොන් 20 එස්කැවේටර් යන්ත්‍රයක් පමණක් සැපයූ සේ සලකා ව්‍යාපෘතිය ආරම්භ කළ 2021 ඔක්තෝබර් සිට 2022 ජූනි දක්වා මාස 8 ක කාලය සඳහා යන්ත්‍ර පැය 254.15 ක් සඳහා යන්ත්‍ර පැයකට රු.6,500 ක් බැගින් රු.1,651,975 ක් ගෙවීම් කර තිබුණි. එසේ වුවද, එම යන්ත්‍රය ටොන් 20 යන්ත්‍රයක් නොව ටොන් 12 එස්කැවේටර් යන්ත්‍රයක් බවට නිරීක්ෂණය වූයෙන් පැයකට රු.1,500 ක් බැගින් පැය 254.15 ක් සඳහා රු.381,225 ක මුදලක් සැපයුම්කරු වෙත වැඩිපුර ගෙවා ඇති බවට නිරීක්ෂණය විය.

(ආ) අක්‍රීය තත්ත්වයේ පවතින මොරටුව ප්‍රාදේශීය කාර්යාලයේ භිතාවි 330 -70433 එස්කැවේටර් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා 2022 ජනවාරි මස කැඳවූ මිල ගණන් අනුව මාර්තු මස තෝරාගත් රු.1,007,000 ක මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරු ඒ සඳහා රු.1,414,300 ක් අවශ්‍ය බවට දැනුම්දී තිබීමෙන් එය ප්‍රතික්ෂේප කර දෙවන අවම මිල වූ රු.1,039,000 ක් ඉදිරිපත් කළ සැපයුම්කරු තෝරා ගතයුතු වුවද, එසේ කටයුතු නොකර අප්‍රේල් මස දින 02 කදී මුලින් මිල ගණන් ඉදිරිපත් කළ අනෙක් සැපයුම්කරුවන් දෙදෙනාගෙන් වෙන වෙනම නැවත වරක් මිල ගණන් ලබාගෙන මුල් සැපයුම්කරුටම රු.1,414,300 කට ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි.

**3.4 අනාර්ථික ගනුදෙනු**

(අ) මොරටුව ලුනාව වෙරළ තීරයේ වෙරළ බාදනය වැළැක්වීම පිණිස මීටර් 410 ක් දිගට ඉදිකරනු ලබන රිවට්මන්ට් බැම්ම සඳහා රු.11,960,100 කට 2021 අප්‍රේල් 25 දිනට ප්‍රථම අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම සඳහා ගිවිසගත් සැපයුම්කරු ද්‍රව්‍ය සැපයුම නවතා දමා තිබීම හේතුවෙන් රු.මී. 17 කට නැවත සකස් කළ ඇස්තමේන්තුවක් මත මුල් ප්‍රසම්පාදනයෙන් නොසැපයූ කුට්ටි ගල් 4549 ක් සපයා ගැනීමේදී දෙපාර්තමේන්තුවට රු. 1,742,267 ක පාඩුවක් සිදුවී ඇති බවට නිරීක්ෂණය විය.

(ආ) වෙරළ කලාපයන් තුළ සිදුකරනු ලබන ඉදිකිරීම් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ බලපත්‍ර ලබාදීම පිණිස රු.5,000,000 කට පද්ධතියක් සකස්කර ගැනීම සඳහා 2016 ජූනි 09 දින ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණ ද, පසුව එම ආයතනය විසින් එම කාර්යය රු. 14,528,000 කට පෞද්ගලික පාර්ශවයකට පැවරීම මත රු.9,528,000 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) මොරටුව ප්‍රාදේශීය කාර්යාලයේ පවතින 2017 වර්ෂයේ රු.28,850,000 කට මිලදී ගෙන 2022 මැයි මස සිට අක්‍රීය තත්ත්වයේ පවතින හිතාචි 330 වර්ගයේ එස්කැවේටර් යන්ත්‍රය සඳහා රු. 1,542,606 ක් ද, හිතාචි 330 -70433 එස්කැවේටර් යන්ත්‍රය හා Hyundai -320 එස්කැවේටර් යන්ත්‍රය සඳහා රු. 1,641,291 ක් ද ගෙවා අළුත්වැඩියා කරගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද එම යන්ත්‍ර 03 අක්‍රිය තත්ත්වයේම පැවතුණු අතර ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය යන්ත්‍ර කුලියට ගෙන තිබුණි. තවද, හිතාචි 330 වර්ගයේ එස්කැවේටර් යන්ත්‍රය සඳහා ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදු නොකර පැයකට ඉන්ධන ලීටර් 24 ක් දහනය වන බවට යන්ත්‍ර පැය 4500 ක් සඳහා ඉංධන තුලනය කර තිබුණි.

(ඈ) දිරායාමට ලක්වෙමින් මොරටුව ප්‍රාදේශීය කාර්යාලයේ නවත්වා ඇති Hyundai -320 එස්කැවේටර් යන්ත්‍රය 2022 නොවැම්බර් 15 දින කළුතර වැඩබිමේ සිට මොරටුව කාර්යාලය වෙත කිලෝමීටර් 25 ක පමණ දුරක් රැගෙන ඒමට ඒ අවට ඇති ආයතනවලින් මිල ගණන් ලබා නොගෙන කිලෝමීටර් 50 ක් පමණ දුරකින් පිහිටි වැලිවේරිය, සියඹලාපෙ හා හෙයියන්තුඩුව යන ප්‍රදේශයන් හි පිහිටි ආයතන 03 කින් මිල ගණන් ලබාගෙන තිබීම හේතුවෙන් ඒ සඳහා රු.100,000 ක් වැය කිරීමට සිදුවී තිබුණි.

**3.5 කළමනාකරණ දුර්වලතා**

එක් තාක්ෂණික නිලධාරියෙකු පමණක් අනුයුක්ත කර ඇති දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු වැඩහල අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

## 4 තිරසාර සංවර්ධනය

### 4.1 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

දේශගුණික ආශ්‍රිත වෙරළබඩ ආපදා වැළැක්වීම හා වෙරළබඩ පරිසර පද්ධති තිරසාර ලෙස සංරක්ෂණය කිරීම යන තිරසාර සංවර්ධන ඉලක්ක යටතේ හඳුනාගත් කෘතීම වැලි පෝෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා බලපෑමට ලක් වූ ප්‍රදේශ හඳුනාගෙන කළමණාකරනය කිරීම මඟින් වැලි කඳු, කඩොලාන සහ ලවණ වගුර හා සංවේදී පරිසර පද්ධති සංරක්ෂණය කිරීම යන ක්‍රියාමාර්ගයන්හි ප්‍රගතියක් නොතිබූ බවට නිරීක්ෂණය විය.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 541 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් තත්‍ය කාර්යමණ්ඩලය 417 ක් වූයෙන් තනතුරු 124 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 15 ක් ද, තෘතීය හා ද්විතික මට්ටම්වල තනතුරු 52 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 57 ක් ද විය. ඉන් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරක්, නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ මට්ටමේ තනතුරු 09 ක්, සිවිල් ඉංජිනේරු තනතුරු 02 ක්, යාන්ත්‍රික ඉංජිනේරු තනතුරක්, ජල විද්‍යා මිනින්දෝරු තනතුරක්, පාලන නිලධාරී තනතුරක්, ප්‍රධාන පරීක්ෂක වැඩ හා වෙරළ ආරක්ෂක තනතුරු 03 ක් හා තාක්ෂණ නිලධාරී (සිවිල්) තනතුරු 07 ක් වශයෙන් ප්‍රධාන තනතුරු 23 ක් එම පුරප්පාඩු අතර විය. තවද, අනුමත සංවර්ධන නිලධාරී තනතුරු 90 ක් වුවද, තත්‍ය සංඛ්‍යාව 110 ක් වූයෙන් 20 ක අතිරික්තක් ද විය. ඒ අනුව තත්‍ය වශයෙන් පවතින තනතුරු සංඛ්‍යාව මත රාජකාරී කටයුතු පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සමාලෝචනය කර අවශ්‍යතාවය අනුව සංශෝධනයන් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය 04

# කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය ප්‍රතිදානය | | |
|---|---|---|---|
| | 100% -90% | 75% - 89% | 50% -74% |
| ඵලදායී ආරක්ෂිත වෙරළ දිග | | | 43% |
| ඵලදායී කෘතිම වැලි පෝෂිත වෙරළ තීරයේ දිග | | | 0% |
| පිරිසිදු කරන ලද වෙරළ දිග | 100% | | |
| සංරක්ෂණය කරන ලද සංවේදී කලාප වර්ග ප්‍රමාණය | | | 0% |
| ප්‍රතිශ්ඨාපනය කරන ලද කඩොලාන ප්‍රමාණය | 100% | | |
| වෙරළබඩ ජල තත්වය PH 8 වඩා වැඩි මට්ටමක තිබේදැයි පරීක්ෂා කිරීම | 100% | | |
| සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාණය | 100% | | |
| දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය | 100% | | |

# ඉටුකරගත හැකි තිරසාර සංවර්ධන ඉලක්කවල (SDG) කාර්ය සාධනය

## 5.1 හඳුනාගත් අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක (SDG)

| ආයතනික අරමුණ අනුව ඉලක්ක | ක්‍රියාමාර්ග | ජයග්‍රහණය පිළිබඳ දර්ශක | 2023 ඉලක්ක | 2023 ප්‍රගතිය | % 0 - 49 | % 50 - 74 | % 75 - 100 | SDG රාමුව තුළ ලබා දී ඇති අදාළ ප්‍රතිපත්ති ඉලක්කය |
|---|---|---|---|---|---|---|---|---|
| 13. ඉලක්ක : දේශගුණික විපර්යාස සහ එහි බලපෑම් වලට එරෙහිව සටන් කිරීමට ඉක්මන් පියවර ගන්න | | | | | | | | |
| 1. දේශගුණය ආශ්‍රිත වෙරළබඩ ආපදා හේතුවෙන් අහිතකර බලපෑම් වැලැක්වීම සහ සැලකිය යුතු ලෙස අඩු කිරීම | 1.1. වෙරළ ආරක්ෂක ව්‍යුහ ඉදිකිරීම. | a. ඵලදායී ආරක්ෂිත වෙරළ දිග | 3500m | 1502m | 43 | | | 13.1. සෑම රටකම දේශගුණය ආශ්‍රිත උවදුරු සහ ස්වභාවික විපත්වලට ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව ශක්තිමත් කිරීම. |
| | 1.2. කෘතිම වැලි පෝෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. | b. ස්ථාවර කරන ලද ඵලදායී කෘතිම වැලි පෝෂිත වෙරළ දිග | 0 | 0 | 0 | | | |
| | 1.3. කඩොලාන තීර ප්‍රතිශ්ඨාපනය කිරීම | c. වගා කරන ලද ප්‍රමාණය | 1000m2 | 2770m2 | | | 100 | |
| 14. ඉලක්ක : තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය කිරීම සහ තිරසාර ලෙස භාවිතා කිරීම | | | | | | | | |
| 2. සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ අඩු කිරීම සහ විවිධ ස්ථානවල වෙරළබඩ ජල තත්ත්ව පරාමිතීන් (චය) මැනීම සහ දත්ත හුවමාරු කිරීම | 2.1. වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | d. පිරිසිදු කරන ලද සමුච්චිත වෙරළ දිග | 2km | 25.5km | | | 100 | 14.1. 2025 වන විට, සමුද්‍ර සුන්බුන් සහ පෝෂක දූෂණය ඇතුළුව, විශේෂයෙන්ම ගොඩබිම පදනම් වූ ක්‍රියාකාරකම් වලින්, සියලු වර්ගවල සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සැලකිය යුතු ලෙස අඩු |

| ආයතනික අරමුණ අනුව ඉලක්ක | ක්‍රියාමාර්ග | ජයග්‍රහණය පිළිබඳ දර්ශක | 2023 ඉලක්ක | 2023 ප්‍රගතිය | % 0 - 49 | % 50 - 74 | % 75 - 100 | SDG රාමුව තුළ ලබා දී ඇති අදාළ ප්‍රතිපත්ති ඉලක්කය |
|---|---|---|---|---|---|---|---|---|
| | 2.2. වෙරළබඩ ජල තත්ත්ව පරාමිතීන් මැනීම. | e. 2026 දක්වා සාමාන්‍ය වාර්ෂික වෙරළබඩ ජලයේ pH මට්ටම 8.0 ට වැඩියෙන් පවතිදැයි පරීක්ෂා කිරීම. | ස්ථාන 04ක පරාමිතීන් මැනීම සහ දත්ත හුවමාරු කිරීම. | ස්ථාන 04ක පරාමිතීන් මැනීම සහ දත්ත හුවමාරු කිරීම සිදු කර ඇත. | | | 100 | 14.3 සෑම තරාතිරමකම වැඩිදියුණු කරන ලද විද්‍යාත්මක සහයෝගීතාවය ඇතුළුව සාගර ආම්ලිකතාවයේ බලපෑම් අවම කිරීම සහ ඒවාට විසඳුම් සෙවීම. |
| 3. සෞඛ්‍ය සම්පන්න සහ ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා ඒවා ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළුව සැලකිය යුතු අහිතකර මානව බලපෑම් වළක්වා ගැනීම සඳහා සාගර සහ වෙරළබඩ පරිසර පද්ධති තිරසාර ලෙස සංරක්ෂණය කිරීම, කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම. | 3.1. බලපෑමට ලක් වූ ප්‍රදේශ හඳුනා ගෙන කලමනාකරණය කිරීම | f. වැලි කඳු, කඩොලාන සහ ලවණ වගුරු හා සංවේදී පරිසර පද්ධති සංරක්ෂණය කරන ලද ප්‍රමාණය | හෙක්ටයාර් 70 | 0 | 0 | | | 14.5 2020 වන විට, ජාතික හා ජාත්‍යන්තර නීතියට අනුකූලව සහ පවතින හොඳම විද්‍යාත්මක තොරතුරු මත පදනම්ව වෙරළබඩ සහ සමුද්‍ර ප්‍රදේශවලින් අවම වශයෙන් සියයට 10 ක් සංරක්ෂණය කරන්න. |

## 5.2 තිරසාර සංවර්ධන අරමුණු වල ජයග්‍රහණ සහ අභියෝග කෙටියෙන් විස්තර කරන්න

හඳුනා ගත් තිරසාර සංවර්ධන ඉලක්ක කරා හැකි උපරිමයෙන් ළඟා වීමට උත්සාහ කරන අතර ඉන් සමහරක් ඉලක්ක පාර්ශවකාර ආයතන සමඟ එකමුතුව ඉටු කර ගත යුතු ව ඇත.

පරිච්ඡේදය 06

# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක කළමනාකරණය

| | අනුමත සේවක | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 43 | 28 | 15 |
| තෘතික | 4 | 0 | 4 |
| ද්විතික | 322 | 274 | 48 |
| ප්‍රාථමික | 172 | 112 | 60 |

## 06.2 ** ආයතනයේ ක්‍රියාකාරිත්වයට මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය කෙටියෙන් සඳහන් කරන්න

01) සේවක ඌනතාවයක් පවතින විට ආයතනයේ කාර්යසාධනය සෘණාත්මක වීම සිදුවේ.

02) කාර්යන්වල කාර්යක්ෂමතාවය අඩුවීම මත වීම ප්‍රතිඵලය ලැබේ.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණුවලත් කාර්ය මණ්ඩලය | වැඩසටහනේ කාලසීමාව | මුළු ආයෝජනය (රු. 1000) | | වැඩසටහනේ ස්වභාවය (විදේශ / දේශීය) | දැනුම ලබා ගැනීම * |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| පැය 100 දෙමළ පුහුණුව | 28 | 2022.12.15 - 2023.06.16 | 25.00 | | දේශීය | |
| ලිපිගොනුකරණ | 40 | 2023.06.28 වක් දින | 10.27 | | දේශීය | |

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න

- ❖ ආයතනයේ විවිධ විෂයන් පිළිබඳ දැනුම යාවත්කාලීන වීම තුලින් ඵලදායිතාව ඉහල නැංවීමට හැකි වීම.
- ❖ පුහුණු වැඩසටහන් තුලින් ආකල්ප හා පුද්ගල සංවර්ධනය, සාමූහික වගකීම් වැඩි දියුණු වීම.
- ❖ සේවකයින්ගේ සේවා අවශ්‍යතා හදුනා ගැනීම තුලින් ඔවුන් ඵලදායී මට්ටමට ලගා වීමට අවශ්‍ය පහසුකම් සැපයීම කඩිකම් වීම
- ❖ පුහුණුව තුලින් ලබා ගන්නා දැනුම නව ක්‍රමවේද හා කාර්යක්ෂම කාර්යාල ක්‍රම තුලින් සේවක අභිප්‍රේරණය ඇති කිරීමට හැකි වීම.

පරිච්ඡේදය 07

# අනුකූලතා වාර්තාව

| අංකය | අයදුම් කිරීමේ අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ) | අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක් | අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර ඇත** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශය | අනුකූල | | |
| 1.2 | රාජ්‍ය අත්තිකාරම් ගිණුම | අනුකූල | | |
| 1.3 | වෙළඳ හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| 2 | **පොත් සහ ලේඛණ නඩත්තු කිරීම (FR445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ (267/2018) අනුව ස්ථාවර වත්කම් ලේඛණ නඩත්තු කර යාවත්කාලීන කර ඇත. | අනුකූල | | |
| 2.2 | පුද්ගලික දීමනා ලේඛනය / පුද්ගලික දීමනා කාඩ්පත් නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම. | අනුකූල | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම. | අනුකූල | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලියාපදිංචි කර නඩත්තු කර යාවත්කාලීන කර ඇත. | අනුකූල | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශනියමිත දිනට භාණ්ඩාගාරයට (CIGAS) සකස් කර ඉදිරිපත් කරනු ලැබේ. | අනුකූල | | |
| 2.6 | චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය පවත්වා ගෙන යාම යාවත්කාලීන කර ඇත. | අනුකූල | | |
| 2.7 | භාණ්ඩ වට්ටෝරු ලේඛනය යාවත්කාලීන කර ඇත. | අනුකූල | | |
| 2.8 | තොග ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කර ඇත. | අනුකූල | | |
| 2.9 | පාඩු ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කර ඇත. | අනුකූල | | |
| 2.10 | බැඳීම් ලේඛනය නඩත්තු කිරීම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල | | |

| අංකය | අයදුම් කිරීමේ අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ) | අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක් | අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍යය ආයතනය තුළ පවරා ගැනීම. | අනුකූල | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම. | අනුකූල | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම. | අනුකූල | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම සකස් කිරීම. | අනුකූල | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම. | අනුකූල | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල නොවේ | සෑම අංශයකින්ම තොරතුරු රැස් කිරීමට කාලයක් ගත වන නිසා | නිවැරදි කිරීමට උපදෙස් දෙනු ලැබ ඇත. |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රේ.134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම. | අනුකූල | | |

| අංකය | අයදුම් කිරීමේ අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ) | අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක් | අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම. | අනුකූල නොවේ | ප්‍රාදේශිය කාර්යාල මඟින් තොරතුරු ලබාගැනීමේදී සැලකියයුතු කාලයක් ගතවේ. | කඩිනමින් පිළිතුරු ලබා දෙන ලෙස උපදෙස් දී ඇත. |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණය විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල | | |
| **7** | **විගණන කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූල | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත්කර එම නිලධාරියා පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම. | අනුකූල | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල | | |

| අංකය | අයදුම් කිරීමේ අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ) | අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක් | අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල | | |
| 9.3 | වාහන ලොග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල | | |
| 9.4 | සෑම වාහන අනතුරක්ම සම්බන්ධයෙන් මූ.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල නොවේ | ඉන්දන වියදම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සිදු කල නොහැකි විය | 2023 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත. |
| 9.6 | කල්බදු කාල සමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල | | |
| **10** | **බැකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම. | අනුකූල | | |

| අංකය | අයදුම් කිරීමේ අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ) | අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක් | අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන වීවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල | | |
| 11.2 | මු.රේ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදනසීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට වළඹීම. | අනුකූල නොවේ | 1101 වැය විෂය සඳහා 2023 වර්ෂයේදී ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම | 2024 වර්ෂයේ සිට ලබා දුන් ප්‍රතිපාදන කළමනාකරණය කිරීමට කටයුතු කිරීම |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සමබන්ධයෙන් මූ.රේ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | ප්‍රමාද වී ඇත | නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇත |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල | | |

| අංකය | අයදුම් කිරීමේ අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ) | අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක් | අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 15 | **අදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අදාළ නොවේ | | |
| 15.2 | රැස් කර තිබූ අදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායමට බැර කර තිබීම. | අදාළ නොවේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අදාළ නොවේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව තිබීම. | අනුකූල | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙක් පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යෑම. | අනුකූල | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු වීහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පණතේ 08වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා කර තිබීම | අනුකූල | | |

| අංකය | අයදුම් කිරීමේ අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ) | අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක් | අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල | | |
| **19** | **මානව සම්පත් සැලස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලස්මක් සකස් කොට තිබීම. | අනුකූල | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැළැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලස්ම පිළියෙළ කිරීම. ධාරිතා සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකිම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් පත් කොට තිබීම. | අනුකූල | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල | | |